සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

නම/විභාග අංකය:-..............................  **පුරවැසි අධ්‍යාපනය**  **කාලය:-පැය 02යි**

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

01. ඔබ පාසලට ඇතුළත් වූ දිනය නිවැරදිව දැනගත හැකි වන්නේ ........................................................................ ය.
(විදුහල්පති තුමාගෙන්/නාම ලේඛනයෙන්/සිසුන් ඇතුළත් කිරීමේ ලේඛනයෙන්)

02. ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය ......................................................................... කොට්ඨාසය වේ.
(ප්‍රාදේශීය ලේකම්/ග්‍රාම නිලධාරී/දිස්ත්‍රික් ලේකම්)

03. පාසල් ගීය ගායනා කරන අවස්ථාවේ දී .................................................. ඉතා වැදගත් ය.
(සීරුවෙන් සිටීම/පහසුවෙන් සිටීම/නිශ්ශබ්දව සිටීම)

04. භෞතික සම්පත් සංරක්ෂණය සඳහා පාසල් සිසුන්ට කළ හැකි ඉතා වැදගත් කාර්යය මින් කුමක් ද? .......................
(පොලිතින් වෙනුවට කඩදාසි භාවිතය/රුක් රෝපණය/ජලනළ මගින් ජලය ලබා ගැනීම)

05. ගම් වැසියන්ගේ පදිංචිය තහවුරු කිරීම ..................................................... තුමාගේ කාර්යයන්ගෙන් එකකි.
(මහජන සෞඛ්‍ය පරීක්ෂක/ප්‍රාදේශීය ලේකම්/ග්‍රාම නිලධාරී)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති වගන්ති හරිනම් (4) ලකුණ ද වැරදි නම් (5) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. අන් අය ඔබේ අනන්‍යතාවයට ගරු නොකිරීම ඔබට ඇති අභියෝගයකි. (       )
07. ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතුවලින් සහජ කුසලතා ඔප් නංවා ගැනීමට හැකිවේ. (       )
08. සැලසුමකට අනුව වැඩකටයුතු කිරීමෙන් සිතේ පීඩාකාරී බව අඩු කරයි. (       )
09. බල ශක්තිය නිපදවා ගැනීම භෞතික සම්පත්වලින් ලැබෙන ප්‍රයෝජනයක් නොවේ. (       )
10. මානව සම්පත් පුහුණු කිරීම රටේ සංවර්ධනයට බාධාකාරී වේ. (       )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. සාර්ථක ජීවිතයක් ගත කිරීමට අප සමාජයෙන් ගත යුතු වැදගත්ම ආදර්ශය කුමක් ද?
(1) උචිත දෙය බැහැර කිරීම  (2) අනුචිත දෙය තෝරා ගැනීම
(3) අන්‍යයන්ගේ සිතැඟි අනුව කටයුතු කිරීම  (4) අන්‍ය මත ඉවසීම

12. ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක ................................................ බෙදා ඇත.
(1) 22කට  (2) 24කට  (3) 26කට  (4) 25කට

13. පරිපාලන දිස්ත්‍රික්කයක ප්‍රධානියා වන්නේ
(1) දිස්ත්‍රික් ලේකම් තුමා ය.  (2) ප්‍රාදේශීය ලේකම් තුමාය
(3) නගරාධිපති තුමාය.  (4) ප්‍රාදේශීය සභා සභාපති තුමාය.

14. සාමූහිකව කටයුතු කිරීම තුළින් ඉටු වන වැදගත්ම කාර්යය වන්නේ මින් කුමක් ද?
(1) කාලය ප්‍රාමාණවත් නොවීම  (2) අසමගිය වර්ධනය වීම
(3) වැඩි මුදලක් වැය වීම  (4) වින්දනයක් ලැබීම



15.

15. පහත ප්‍රකාශ අතරින් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් ඉටුවන සේවාව කුමක් ද?

(1) රජයේ ආධාර බෙදීම

(2) බල ප්‍රදේශය තුළ සිසුන්ගේ රෝග පරීක්ෂාකර ඖෂධ ලබාදීම.

(3) ලිපි පාර්සල් බෙදා දීම

(4) සිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂාව



**ව සපයා ඇති පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

A

16. A පින්තූරයෙන් දැක්වෙන මානව සම්පත නම් කරන්න.

.............................................................................................

17. ඔහුගෙන් සැලසෙන සේවයක් දක්වන්න.

.............................................................................................



B

18. B පින්තූරයෙන් දැක්වෙන මානව සම්පත නම් කරන්න.

.............................................................................................

19. ඔහු සේවා සැපයීම සඳහා භාවිත කරන ස්වාභාවික සම්පතක් නම් කරන්න.

.............................................................................................

20. සොබා දහමින් ලබා දී ඇති සම්පත්වලට හානියක් නොවන සේ පරිහරණය කිරීම මානව සම්පත සතු ........................... කි.

(ල. 2 5 20 = 40)

## II කොටස

l **පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරක් ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

l **පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක් ද, අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.**

01. (1) ඔබ පදිංචි නිවස අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම හා අංකය ලියන්න.

.............................................................................................

(2) නගර සභාවලින් ඉටුවන සේවාවන් 2ක් ලියන්න.

.............................................................................................

.............................................................................................

(3) ඔබ ජීවත්වන පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක නම් කරන්න.

.............................................................................................

(4) ඛණිජ සම්පත්වලින් ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

.............................................................................................

.............................................................................................

(5) ඔබේ පාසල් නිල ඇඳුම තුළින් ප්‍රකාශ වන ගුණාංග 2ක් ලියන්න.

.............................................................................................

.............................................................................................

(6) පාසල ප්‍රජා සේවා සඳහා යොදාගන්නා අවස්ථා 2ක් සඳහන් කරන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(7) පස සංරක්ෂණය සඳහා යොදාගත හැකි ක්‍රම දෙකක් ලියන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(8) මිනිසුන් සාමුහිකව කටයුතු කරන අවස්ථා දෙකක් ලියන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

(ලකුණු 2 5 8 = 16)

02. (1) ඔබට ඔබේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට සහ ඔබේ හැකියා වර්ධනය කරගැනීමට රජය සපයා ඇති පහසුකම් 3ක් ලියන්න. (ලකුණු 3)

.............................................................................................................................................................

.............................................................................................................................................................


.............................................................................................................................................................

(2)

| ඔබ භුක්තිවිඳින අයිතිවාසිකම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. | |
|---|---|
| අයිතිවාසිකම් | ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් |
| අධ්‍යාපනය ලැබීමට ඇති ඇති අයිතිය | 1. .............................................................................................................<br>2. ............................................................................................................. |
| ආරක්ෂා සහිතව සිටීමට ඇති අයිතිය | 1. .............................................................................................................<br>2. ............................................................................................................. |
| සමාන ලෙස සැලකුම් ලැබීමට ඇති අයිතිය | 1. .............................................................................................................<br>2. ............................................................................................................. |
| තම අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය | 1. .............................................................................................................<br>2. ............................................................................................................. |

(ලකුණු 8)

03. (1) ඔබ ජීවත්වන ප්‍රදේශය අයත්වන පරිපාලන ඒකක පහළ තලයේ සිට ඉහළට විහිදී ඇති ආකාරය පහත රූපසටහනකින් ... න්න.



(ලකුණු 4)

(2) පහත සඳහන් 'අ' සහ 'ආ' තීරු නිවැරදිව යා කරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| බස්නාහිර | අනුරාධපුරය |
| | රත්නපුරය |
| උතුරුමැද | ගම්පහ |
| | කෑගල්ල |
| | කළුතර |
| සබරගමුව | පොළොන්නරුව |
| | කොළඹ |


(ලකුණු 7)

04. (1) ඔබ ජීවත්වන ප්‍රදේශයේ පවත්නා භෞතික සම්පත් බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න.

1. ..............................................................  2. .........................................................

(ලකුණු 2)

(2) භූමිය නැමති භෞතික සම්පත පුද්ගල සමාජ හා ආර්ථික අවශ්‍යතා සඳහා යොදා ගන්නා ආකාරය පහත සටහනිප




(ලකුණු 3)

(3)

| | |
|---|---|
| වඩු කාර්මිකයන්, | ඉංජිනේරුවන් |
| වෛද්‍යවරු | පෙදරේරුවන්. |
| කම්කරුවන් | ගුරුවරු |

| ඉහත කොටුව තුළ සඳහන් මානව සම්පත් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. | |
|---|---|
| බුද්ධිමය හැකියා | කායික හැකියා |
| 1. ........................................................................ | 1. ........................................................................ |
| 2. ........................................................................ | 2. ........................................................................ |
| 3. ........................................................................ | 3. ........................................................................ |

(ලකුණු 6)

05. (1) ඔබගේ කටයුතුවලට සහායවන රජයේ සේවකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

1. .........................................................

2. .........................................................

3. ..........................................................

පහත දැක්වෙන්නේ පුද්ගලයින්ගේ අවශ්‍යතා ඉටුකිරීමට සහය වන ආයතන මගින් ඉටුකෙරෙන කාර්යයන් කිහිපයකි. ඒ තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

A දහම් දැනුම ලබා දීම

B රෝගවලට ප්‍රතිකාර කිරීම

C ආගමික වත් පිළිවෙත් පුදපූජා පැවැත්වීම

D තම බල ප්‍රදේශයේ මංමාවත් පිළිසකර කිරීම හා ඉදිකිරීම

E උප්පැන්න සහතික නිකුත් කිරීම

F හදිසි අනතුරුවලට ලක්වූවන්ට සුවය ලබාදීම

G සහනාධාර ලබාදීම

H කුණු කසල බැහැර කීරීම හා මංමාවත් පිරිසිදු කිරීම

| ආයතනය | ඉටුවන කාර්යයන් |
|---|---|
| 1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1. .................................................<br>2. ................................................. |
| 2. රෝහල | 1. .................................................<br>2. ................................................. |
| 3. ප්‍රාදේශීය සභාව | 1. .................................................<br>2. ................................................. |
| 4. පන්සල | 1. .................................................<br>2. ................................................. |

(ලකුණු 8)

06. (1) ඔබ ජීවත්වන ප්‍රදේශය තුළ දක්නට ලැබෙන සමිති 2ක් හා ඒවායින් ඉටුවන සේවා 2 බැගින් ලියා පහත වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| සමිතිය<br>1. ............................................ | ඉටුවන සේවා<br>1. ................................................................................ |
| 2. ............................................ | 2. ................................................................................<br>1. ................................................................................ |

2. ................................................................................

(ලකුණු 6)

(2) ඔබට සේවා සපයන ආයතනවල යුතුකම් හා සේවා ලබාගන්නා ඔබ සතු යුතුකම් පහත දක්වා ඇත. ඒවා නිවැරදිව අදාල වගුවෙහි සටහන් කරන්න.

A නිසිපරිදි බදු මුදල් ගෙවීම

B නිවැරදි උපදෙස් හා මගපෙන්වීම ලබාදීම

C සේවාවන් නිසි අයුරින් ලබා දීම

D සේවා සපයන ආයතන හා දේපල රැක ගැනීම

E අපක්ෂපාතීව හා කාර්යක්ෂමව කටයුතු කිරීම

| සේවා සපයන ආයතනවල යුතුකම් | සේවා ලබන අය සතු යුතුකම් |
|---|---|
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |
| ................................................................................ | ................................................................................ |

(ලකුණු 5)

07. 1. සාමුහිකව කටයුතු කිරීමෙන් ඔබ තුළ වර්ධනය වන ගුණාංග 4ක් ලියන්න.

1 ................................................................ 2. ................................................................


3. ................................................................ 4. ................................................................

(ලකුණු 04)

2. පහත දැක්වෙන උපකාරක පද ඇසුරෙන් ප්‍රහේලිකාව පුරවන්න.

පහළට
1. දකුණු පළාතට අයත් දිස්ත්‍රික්කයකි.
2. මෙම නගරය මහනගර සභා බල ප්‍රදේශයකි.
4. නගර සභාවේ ප්‍රධානියා වේ.

හරහට
3. සාමුහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයකි.
5. මිනිසුන් සාමුහිකව වැඩකරන අවස්ථාවකි
6. අවමංගල කටයුතුවලට සහය දෙන ආයතනයකි.
7. ඔබට පහසුවෙන් සම්බන්ධතා පැවැත්විය හැකි පරිපාලන නිලධාරියෙකි.




(ලකුණු 7)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 6 - 2017

## පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 1. සිසුන් ඇතුළත් කිරීමේ ලේඛනය | 2. ග්‍රාමනිලධාරි | 3. සීරුවෙන් සිටීම | 4. රුක් රෝපනය |
| 5. ග්‍රාමනිලධාරි | 6. 3 | 7. 4 | 8. 4 |
| 9. 5 | 10. 5 | 11. 4 | 12. 4 |
| 13. 1 | 14. 3 | 15. 4 | 16. ගොවියා |
| 17. ආහාර (වී, සහල් හෝ නිවැරදි පිළිතුර) | 18. වඩු කාර්මිකයා | 19. වනාන්තර (දැව) | 20. යුතුකම |

### II කොටස

01. (1) අදාල පිළිතුරුවලට ලකුණු දෙන්න.
(2) මංමාවත් ඉදිකිරීම/නගර පිරිසිදු කිරීම (පිටු අංකය 64)
(3) කුරුණෑගල, පුත්තලම
(4) කර්මාන්ත සඳහා යොදා ගැනීම, ප්‍රවාහන සඳහා භාවිත කිරීම
(5) පාසලේ අනන්‍යතාව/පාසලේ ගෞරවය/සමාන බව/චාම් බව (පිටුව 35 බලන්න)
(6) පාසලේ රැස්වීම් ශාලාව හෝ ගොඩනැගිලි, ක්‍රීඩා පිට්ටනිය, විවිධ උත්සව, රැස්වීම් ආදිය සඳහා භාවිත කිරීම, සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම ආදී නිවැරදි පිළිතුරු දෙකකට ලකුණු දෙන්න.
(7) වැටි බැඳීම/ජලය බැසීමේ කානු කැපීම
(8) ශ්‍රමදාන/ආගමික උත්සව/අවමංගල අවස්ථා/මංගල අවස්ථා හදිසි ආපදා අවස්ථා ආදී නිවැරදි පිළිතුරු දෙකකට ලකුණු දෙන්න. (ල. 2 5 8 = 16)

02. (1) නොමිලේ අධ්‍යාපනය ලබාදීම, නොමිලේ පාසල් පොත් ලබාදීම, නිල ඇඳුම් ලබා දීම, ක්‍රීඩා උපකරණ විද්‍යාගාර පහසුකම් (පිටුව 36 බලන්න.) (ල. 03)
(2) **අධ්‍යාපනය ලැබීම** - හොඳින් ඉගෙන ගැනීම
විභාග හොඳින් සමත්වීම
ගුරුවරුන්ට කීකරුව විනය ගරුකව සිටීම
**ආරක්ෂා සහිතව සිටීම** - අන් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙස කටයුතු කිරීම
යහළු යෙහෙළියන් වැරදි වැඩ වලින් වළක්වා ගැනීම
පාසල තුළ සම්පත් ආරක්ෂා කිරීම
**සමාන ලෙස සැලකුම් ලැබීමට**- ගුරු දෙමාපියන්ට කීකරුවීම. ගෞරව කිරීම,
අනෙක් සිසුන්ට ගරු කිරීම, පහත් කොට නොසැලකීම
**තම අදහස් ප්‍රකාශ කිරීමට** - අන් අයගේ අදහස්වලට ඇහුම්කන් දීම, එම අදහස්වලට ගරු කිරීම, අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම
ඉහත දැක්වූ කරුණුවලින් දෙක බැගින් ලියා ඇත්නම් ලකුණු දෙන්න. නැතහොත් අදාල නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න. (පිටුව 37 බලන්න.) (ලකුණු 8)

03. (1) A ග්‍රාම නිලධාරි කොට්ඨාසය
B ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
C දිස්ත්‍රික්කය
D රට (ලකුණු 4)
(2) බස්නාහිර -ගම්පහ/කොළඹ/කළුතර
උතුරුමැද - අනුරාධපුරය/පොළොන්නරුව
සබරගමුව - කෑගල්ල/රත්නපුරය (ලකුණු 7)

04. (1) ස්වාභාවික/ස්වාභාවික නොවන (මිනිසා විසින් නිර්මාණය කරන) (ලකුණු 2)
(2) 1 - නිවසක් ඉදිකිරීම
2 - ආහාර අවශ්‍යතා සඳහා වගා කිරීම
3 - කර්මාන්ත පුර ඉදිකිරීම (ලකුණු 3)
(3) බුද්ධිමය හැකියා -
වෛද්‍යවරු/ඉංජිනේරුවරුන්/ගුරුවරු
කායික හැකියා -
වඩු කාර්මිකයන්/කම්කරුවන්/පෙදරේරුවන් (ල. 6)

05. (1) වෛද්‍යවරු/ගුරුවරු/පොලිස් නිලධාරීන්/මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා/හෙදියන්/පවුල් සෞඛ්‍ය සේවිකාව/බැංකු නිලධාරීන්/ආදී නිවැරදි පිළිතුරු 2කට ලකුණු දෙන්න. (ල. 3)
(2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - E, G
රෝහල - B, F
ප්‍රාදේශීය සභාව - D, H
පන්සල - A, C (ල. 8)

06. (1) අවමංගල්‍යාධාර සමිති /සුබසාධක සමිති/ ණය දෙන සමිති /බෞද්ධ සමිති /ක්‍රීඩා සමිති (පිටුව 68) (ල .2)
(2) අදාළ නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න. (69 පිටුව) (ල. 4)
(3) සේවා සපයන ආයතනවල - B, C, E
සේවා ලබන අය - A, සහ D (ල. 5)

07. (1) එකමුතුකම/සහයෝගය/ඉවසීම/කණ්ඩායම් හැඟීම අන් අයට ගරු කිරීම/සුහදශීලී බව/නායකත්වයට ගරු කිරීම ආදී නිවැරදි පිළිතුරු 4කට ලකුණු දෙන්න.
(2) **පහළට** 1. ගාල්ල 2. මහනුවර 4. සභාපති (ල. 3)
**හරහට** 3. සහෝදරත්වය 5. මංගල උත්සවය
6. පන්සල 7. ග්‍රාම නිලධාරි (ල. 4)